# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/14 - 2022 දෙසැම්බර් මස 13 වැනි අඟහරුවාදා - 2022.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී- 11/2007 (ii)

**2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත**

2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 22 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 95 වන වගන්තිය යටතේ කෘෂිකර්ම, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද අමරවීර,
කෘෂිකර්ම, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2009 ජනවාරි මස 21 වැනි දින අංක 1585/15 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2009 අංක 1 දරන කෘෂිකාර්මික ඉඩම් (කළමනාකරණ) නියෝග පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1. එහි 2 වන නියෝගයේ (3) වන අනු නියෝගයේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඇ). ඉහත (ආ) ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව කටයුතු කිරීම, යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරු විසින් පැහැර හැර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඔහු විසින්, 27 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර එකී ඉඩමේ බුක්තිය බාර ගැනීමෙන් පසුව සහ යම් ආරවුලක් වෙතොත්, එම ආරවුල විසඳා ගනු ලබන තෙක්, යම් නිශ්චිත කාලසීමාවකට සුදුසු තැනැත්තකු, ආයතනයක් හෝ සංවිධානයක් මගින් එකී ඉඩම වගා කරවීමට කටයුතු කරනු ලැබිය යුතු ය.

EOG 12 - 0145

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 6096 — 531 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*